# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1686/22 - 2010 දෙසැම්බර් 29 වැනි බදාදා - 2010.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අදාළව සාදන ලද, 2005 ජූලි මස 08 වැනි දින හා අංක 1400/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කරනු ලබන මේ නියමයෙන්, එම උපලේඛනයෙහි I වැනි තීරයේ දැක්වෙන "සංගීත පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව එම උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් වන්නාවූ සියලු අයිතම ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"උපලේඛනය

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *පීඨය* | *අධ්‍යයන අංශ* |
| සංගීත පීඨය | උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය |
| | මානව වංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය |
| | ව්‍යවහාරික සංගීත සහ ජන සන්නිවේදන අධ්‍යයනාංශය |
| | දක්ෂිණ භාරතීය සංගීත අධ්‍යයනාංශය |
| | බටහිර සංගීත අධ්‍යයනාංශය |
| | සංගීත විද්‍යා අධ්‍යයනාංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

01- 229

1A - G 13993 —835 (2010/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.